**කාබනික පොහොර නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ කෙටි වීඩියෝ ප්‍රවර්ධන වාර්තාමය වැඩසටහනක් සැකසීම සඳහා නිර්මාණ සංකල්ප සහ ඇස්තමේන්තුගත මිල ගණන් කැඳවීම.**

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යය දැක්ම වැඩ වැඩපිළිවෙළ යටතේ ක්‍රියාත්මක වන කාබනික පොහොර නිෂ්පාදන ක්‍රියාවලිය බල ගන්වනු ලබන ඉඩම් සේවා ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මේවන විට රජරට මූලික කරගනිමින් මධ්‍යස්ථාන 25 කට අධික ප්‍රමාණයක ක්‍රියාත්මක කරනු ලබන කාබනික පොහොර නිෂ්පාදන ක්‍රියාවලියත් එම යාන්ත්‍රණයත්, ගම්වාසීන්ගේ හා ගොවි ජනතාවගේත්, ඒ පිළිබඳ පවත්නා සුභවාදී නැඹුරුතාවයත් එක්කොට ගනිමින් කෙටි වීඩියෝ ප්‍රවර්ධන වාර්තාමය වැඩසටහනක් (documentary) සැකසීම සඳහා තම නිර්මාණ සංකල්ප සහ ඇස්තමේන්තුගත මිල ගනන් අප වෙත ඉදිරිපත් කිරීමට මෙසේ මාධ්‍ය ප්‍රචාරණ නිර්මාණ හා නිෂ්පාදන ආයතන සඳහා ඇරයුම් කරනු ලැබේ. එමෙන්ම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් සිදුකරන මෙම මෙහෙයුම බලගැන්වීමට ප්‍රවර්ධනකරීමටත් කෙටි තේමා සංගීතමය හා ගීතමය නිර්මාණයක් (jingle) එකක්ද අපේක්ෂා කරමු. එයටද වීඩියෝ දර්ශන ඇතුලත් කර තප්පර 30ක ප්‍රමාණයට කෙටි දැන්වීමක් සමාජ මාධ්‍ය හා රූපවාහිනී මාධ්‍ය තුළ ප්‍රචාරණය සඳහා ඔබ ආයතනයෙන් නිෂ්පාදනය කර සකසා ගැනීමට අපේක්ෂා කරමු.

**කාබනික පොහොර නිෂ්පාදන කෙටි වාර්තාමය වීඩියෝ පටයත් සහ තේමා සංගීතයකින් යුත් 30 sec වීඩියෝ දැන්වීමත් සඳහා පහත සඳහන් දේ ගැන සැලකිලිමත් වන්න.**

**<u>කෙටි වාර්තාමය වීඩියෝ පටය</u>**

1. කාලය විනාඩි 10 - 15 අතර
2. නිර්මාණාත්මක ආරම්භයක්, අවසානයකින් යුතුව කාබනික පොහොර නිෂ්පාදන ක්‍රියා වලිය රූපගත කිරීම.
3. ජනාධිපතිතුමාගේ කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳව ප්‍රකාශයක් කෙටියෙන් ඇතුළත් විය යුතුය.
4. අමාත්‍යතුමාගේ සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති තුමාගේ අදහස් දැක්වීමක් එක් කළ යුතු අතර අනෙකුත් රූපරාමු සඳහා ඔබ ආයතනයේ නිර්මාණාත්මක අදහස් අපේක්ෂා කරන්නෙමු.
5. පසුබිම් සංගීතය සහ පසුබිම් කථනය හෝ ඉදිරිපත් කරන්නෙකු ඔබට භාවිතා කළ හැක.
6. මීට අමතරව ඔබ ආයතනය සතු නිර්මාණාත්මක අදහස් සහ සංකල්ප එක් කරන්න.

**තේමා සංගීතයකින් යුත් 30 sec වීඩියෝ දැන්වීම**

1. උසස් රිද්මයකින් යුත් සංගීතමය සංයෝජනයක් වීම
2. පදරචනය
3. වෘතිමය ගායන ශිල්පීන් යොදා ගැනීම
4. රූප රචනය සහ නිෂ්පාදනය